# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

11 කාණ්ඩය 07 කලාපය

2025 නොවැම්බර්

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු 70.00


# අපේ දේශපාලනය සටන්කරන ජනතාව සමග - කුමාර් ගුණරත්නම් සහෝදරයා

**කුමන අභියෝග පැමිණියත් ජනතාව වෙනුවෙන් සටන් කරන වගකීම පෙ.ස.ප. විසින් අත්හරින්නේ නැති බව පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම් කුමාර් ගුණරත්නම් සහෝදරයා පවසයි. මේ දිනවල යුරෝපයේ වමේ පක්ෂ සමග සාකච්ඡා කරමින් දේශපාලන සබඳතා ගොඩනගමින් සිටින ඔහු මේ බව ප්‍රකාශ කළේ ඉතාලියේ ලාංකිකයන් පිරිසක් අමතමිනි. වැඩිදුරටත් අදහස් දක්වමින් ඔහු කියා සිටියේ, අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන ජනතාව සමග අරගලය ශක්තිමත් කිරීමේ දේශපාලන වගකීම පෙ.ස.ප. අත් නොහරින බවයි.**

පහත පළ කෙරෙන්නේ කුමාර් ගුණරත්නම් සහෝදරයා ඉතාලියේ බ්‍රෙසියා නගරයේදී ලාංකිකයන් අමතා පළ කළ අදහස්වල සාරාංශයකි.

"කවුරුත් බලාපොරොත්තු නොවෙච්ච විශාල ජයග්‍රහණයක් එක්ක ජනතා විමුක්ති පෙරමුණු නායකත්වය දෙන මේ ආණ්ඩුව බලයට පත්වුණා. මෙතෙක් කල් රටේ ආණ්ඩු කළ ප්‍රභු පෙලැන්තියේ අය වෙනුවට අපි වගේ සාමාන්‍ය පන්තියේ පිරිසක් බලයට පත් වුණා. අපි ඒ වෙනස පිළිගන්න ඕන. මේ වෙනස නිසාම 76 වසරක් ප්‍රභූ පාලනය යටතේ පැවති දේවල් වෙනස් වෙයි කියල 02 වැනි පිටුවට..




මේ වනවිට වෙනිසියුලාවට එරෙහිව එක්සත් ජනපදය විසින් ගෙනයන ආක්‍රමණකාරී බලහත්කාරයටත් ඊශ්‍රායලය ගාසා තීරයේ සිදුකරන වර්ග සංහාරයටත් එරෙහිව ලෝකයේ ජනයා ලක්ෂ ගණනින් උද්ඝෝෂණ කරති. මෙහි දැක්වෙන්නේ එරෙහිවන ලෙස ඔස්ට්‍රේලියානු ආණ්ඩුවට බලකරමින් ඔක්තෝබර් 25වැනිදා මෙල්බර්න් නගරයේ පැවති විරෝධතාවකි.

## 2025 පළමු මාස හයට ණය බර බිලියන 2998ක් බදු බර බිලියන 2300!

2025 වසරේ පළමු අර්ධය අවසන් වන විට මෙරට ජනතාව ලබාගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 2998කි. මහ බැංකුවේ තොරතුරුවලට අනුව මෙම වසරේ මුල් මාස හයට ආණ්ඩුවේ සමස්ත බදු ආදායම වන රුපියල් බිලියන 2318ක් වන නිසා එය පසුගිය වසරේ අදාළ කාලයට සාපේක්ෂව 25%ක වැඩි වර්ධනයකි.

මෙරට මූල්‍ය ආයතන හරහා ලබාගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 1837ක් බව වාර්තා වේ. මෙයින් රුපියල් බිලියන 1161ක් වාහන ආනයනය සඳහා ගෙන ඇති බවද එයින් 14%ක් ලබාගෙන ඇති රන්

## දරුවන් 188,000ට මන්දපෝෂණය 10,000කට උග්‍ර මන්දපෝෂණය

ලංකාවේ වයස අවුරුදු පහට අඩු, අඩු බරින් යුත් දරුවන් 187,714ක් සිටින බවත්, උග්‍ර මන්දපෝෂණයෙන් පෙලෙන දරුවන් 10,000ක් රට පුරා සිටින බවත් මධ්‍යස්ථ මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් 91,000ක් සිටින බවත් 'ශ්‍රී ලංකා පවුල් සෞඛ්‍ය සේවා කාර්යාංශය' මගින් නිකුත් කළ නවතම නවතම 2025 පෝෂණ වාර්තාවේ සඳහන් වේ.

ලංකාවේ පවුල් සෞඛ්‍ය සේවා කාර්යාංශය මගින් නිකුත් කළ නවතම 2025 වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවේ වයස අවුරුදු පහට අඩු දරුවන් අතරින් නියමිත උස නොමැති දරුවන් 118,658ක්ද, උසට ගැලපෙන බර නොමැති දරුවන් 100,938ක්ද පමණ සිටින බව අනාවරණය වේ.

නුවරඑළිය, අනුරාධපුරය, මහනුවර, මඩකලපුව, ත්‍රිකුණාමලය,

## අපනයන ආදායම ඉහළට ධනපතියන්ගේ මල්ල පිරේ

2025 වසරේ සැප්තැම්බර් 30 න් අවසන් වූ මාස නමය තුළින් මෙරට අපනයන ආදායම පසුගිය වසරේ මුල් මාස නමයට සාපේක්ෂව 7%න් වර්ධනය වූ බව අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) පෙන්වා දෙයි.

ඒ අනුව 2025 සැප්තැම්බර් 30 වන විට ලංකාවේ අපනයන ආදායම ඩොලර් බිලියන 12.98ක් බව ප්‍රකාශ වේ. එය 2025 වසරේ අපේක්ෂිතය අපනයන ආදායමෙන් 72%ක අගයකට ළඟාවීමකි.

සැප්තැම්බර් මාසයේ වෙළඳ භාණ්ඩ අපනයනය කලින් වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඩොලර් මිලියන 1163.33 වර්ධනය වී ඇති බව වාර්තා වේ. එම වාර්තාවට අනුව සැප්තැම්බර් මාසයේ සේවා අපනයනයේ වටිනාකම ඩොලර් මිලියන 306.09ක් වේ.

2025 සැප්තැම්බර් මාසයේ ප්‍රධාන අපනයන ක්ෂේත්‍රවල ආදායම් 2024 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව වර්ධනය වී ඇති ආකාරය

## නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයෙන් පාසල් වසයි - කාලය දිගු වේ

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ සිසුන් 50ට අඩු පාසල් වසා දැමීමටත් පාසල් පැවැත්වෙන කාලය පැය 3කින් දීර්ඝ කිරීමටත් ආණ්ඩුව සිය අවධානය යොමු කරමින් සිටී.

සිසුන් 50ට අඩු පාසල් 1308ක සිසුන් ආසන්න පාසල්වලට අනුයුක්ත කිරීම හා ඔවුන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට තමන් සැලසුම් කරන බව ආණ්ඩුව පුන පුනා ප්‍රකාශ කරයි. මෙම කාණ්ඩයේ පාසල්වල සිසුන් 44,000ක් පමණ ඉගෙනුම ලබන අතර එතරම් සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කරගැනීමට අනෙක් පාසල්වල ඉඩකඩ තිබේදැයි තමන් සමීක්ෂණය කරන බව අධ්‍යාපන බලධාරීහු පවසති.

ග්‍රාමීයව මෙන්ම නාගරිකවද අඩු ආදායම්ලාභී ආර්ථික වශයෙන් දුෂ්කර පවුල්වල දරුවවෝ මෙම පාසල්වල 07 වැනි පිටුවට..

## ආණ්ඩුව ටෙන්ඩර් කැඳවීමේ විනිවිදභාවය අත්හරී!

ආණ්ඩුව ඩීසල් කැබ් රථ 1775ක් මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමේදී ටෙන්ඩර් පටිපාටි සම්බන්ධව විශ්වාසීභාවය නොසලකා හැර තිබෙන බව වාර්තාවේ.

මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට ඔක්තෝබර් 23 සිට නොවැම්බර් 04 දක්වා කාලය ලබාදී ඇත්තේ වැඩ කරන දින හතක් පමණක් හිමිවන පරිදිය. මෙම ටින්ඩර් කැඳවීමේ ලිපියේ කොන්දේසිවලට අනුව අදාළ දිනයට ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත්තේ එක් සමාගමකට පමණක් බව වාහන අලෙවි ක්ෂේත්‍රයේ සාකච්ඡාවට ලක්වී තිබේ. ටෙන්ඩරයේ කොන්දේසි වෙනස් කිරීමට කරනු ලැබූ ඉල්ලීම් සාර්ථක වී නැත. සාමාන්‍යයෙන් ලංකාවේ ආණ්ඩුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව රුපියල් මිලියන 50 හෝ ඊට වැඩි ටෙන්ඩර සඳහා කැලැන්ඩර දින 21කුයි අවම කාලයක් ලබාදිය යුතුය. ටෙන්ඩර ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා විවෘත කරන්නේ නම් ඒ සඳහා කැලැන්ඩර දින 42ක් ලබා දිය යුතුය.

දේශීය වෙළඳපළ හරහා කරනු ලබන සාමාන්‍ය මිලදී ගැනීම්වලදී කැලැන්ඩර දින හතක සීමාවක් යොදාගත හැකිය. හදිසි මිලදී ගැනීම සඳහා වුවද ප්‍රායෝගික හා සාධාරණ බව හා ප්‍රායෝගික කාලයක් ලබාදිය යුතු බව සාමාන්‍ය නීතියේ සඳහන්ය. ඒ අනුව ඩීසල් ඩබල් කැබ් රථ 1775ක් මිලදී ගැනීම සඳහා වැඩ කරන දින හතක කාලසීමාවක් තුළ ටෙන්ඩර් කැඳවා අවසන් කිරීම ඉහත වර්ගීකරණයන් හරහා සාධාරණීකරණය කළ නොහැක.

මේ ජනතා මුදල් වියදම් කිරීමේ පටිපාටිය පූර්ණ විනිවිද භාවයකින් පවත්වා ගතයුතු බවට වන ප්‍රතිපත්තිය ඊනියා නීති රාමුවට මුවා වී උල්ලංඝනය කිරීමකි.

## ජීවන වියදමෙන් දකුණු ආසියාවේ දෙවැනි තැනට

ජීවන වියදම අධිකම දකුණු ආසියානු රටවල් අතරේ දෙවැනි තැනට ලංකාව ඇද වැටී ඇත. දකුණු ආසියාවේ වැඩිම ජීවන වියදමක් වාර්තා වන මාලදිවයිනේ වැසියකුට සාමාන්‍ය ජීවන තත්වයක් සඳහා වැයබර මාසිකව ඩොලර් 804ක් බව ගණන් බලා ඇත.

Numbeo වෙබ් අඩවියේ වාර්තාවකට අනුව, ලංකාවේ පුරවැසියෙකකුට මාසයක කාලයක් සාමාන්‍ය තත්වයෙන් ජීවත් වීමට දළ වශයෙන් අමෙරිකානු ඩොලර් 506 (ආසන්න වශයෙන් රුපියල් 153,999) ක් අවශ්‍යය වේ. නිවාස කුලී ගාස්තු අඩංගු නොවන මෙම වියදම් ප්‍රමාණය සපයා ගැනීම දුෂ්කර තත්වයක් ආර්ථික අර්බුදයෙන් පීඩා විඳින ලාංකිකයන් බහුතරයකට ඇත. කෙසේවුවත්, කොළඹ නගරයේ ජීවත්වෙන පවුලකට සුවදායී ජීවිතයක් ගතකිරීමට දළ වශයෙන් මාසිකව රුපියල් 570,997 ක් අවශ්‍ය වන බව එම වාර්තාව අනාවරනය කරයි.

2019 අප්‍රේල් මස පාස්කු ප්‍රහාරයෙන් පසුවද කොරොනා වසංගතයෙන්ද දිගින් දිගටම සිදුවුණු ආර්ථික බිඳවැටීම් නිසා ලංකාවේ ජීවන වියදම ඉහළ නැග අත. 2019 දි 3.5% ක් වූ උද්ධමනය 2022 දී ඉතිහාසයේ වාර්තාවුණ වැඩිම අගය 67.4% දක්වා ඉහළ ගියේය. ඉන්පසුව විදේශ විනිමය සංචිත හිගය හා රුපියල අවප්‍රමාණය වීමත් සමග ආනයනික භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම සහ ඒ අනුව, දේශීය නිෂ්පාදන මිල ඉහළ යාම 2022 අරගලයකට මාවත විවර කෙරිණි.